

**දේශපාලකයන්ට යට නොවූ එකම සිංහල ලේඛකයා වූ ගුණදාස අමරසේකර - සිංහල මහැදුරන් පරයන නිවැරදි සිංහලෙන් ලිවීමට සමත් ගණිත මහැදුරු නලින් ද සිල්වා - 1972-78 වසරවල පවත්වන ලද සේවක මණ්ඩල නියෝජිත පුහුණු පාඨමාලාවන්හිදී "විද්‍යාත්මක ප්‍රවේශය" යන සුවිශේෂ මාතෘකාව යටතේ පැය තුනක පමණ දීර්ඝ දේශනයක් පවත්වා අප මවිතයට පත් කළ වෛද්‍ය කාලෝ ෆොන්සේකා යන ත්‍රිමූර්තිය අද දවසේ මහින්ද රාජපක්ෂගේ වන්දි භට්ටයන් බවට විහින්ම පත් වීම ජාතියේ අභාග්‍යය කියා පාන අගනා (එහෙත් සෝචනීය) සාධකයකි.**

# ඇතුළත වත ගොත

කත්තිරම
ඩී බී කුරුප්පු

ඉඩක් ලද හැම විටකම එස්බීඑස් රූපවාහිනියේ සති පතා ප්‍රදර්ශනය වන "ඉන්සයිට්" වැඩ සටහන නැරඹීම මගේ පුරුද්දකි. 2015 ජූලි 11 අඟහරුවාදා වැඩ සටහන අන් බොහෝ වැඩ සටහන් පරයා යන අගයකින් යුතු විය.

හැත්තෑ වසරකට ඉහත ඇමෙරිකාව විසින් හිරෝෂිමා සය නාගසාකි නගරවලට පතිත කරන ලද පරමාණු බෝම්බයෙන් සිදුවූ මිනිස් ඝාතනය සහ මහා විනාශය සිහිපත් කරනු වස් ඉදිරිපත් වූ එයට සහභාගි කරවා ගන්නා ලද පිරිස ද සුවිශේෂ වූහ.

ඒ "සත් ක්‍රියාව" කරන්නට අණ දුන් ඇමෙරිකානු ජනාධිපති ට්‍රෑමන් ගේ මුනුබුරා - ජපානය යුදට මෙහෙයවූ අගමැති ටෝජෝගේ මුනුබුරා - මහා යුද්ධයේ ආරම්භකයා වූ හිට්ලර්ගේ ප්‍රධාන හමුදා නායකයකුගේ මුනුපුරෙක් - සෝවියට් නායක ජෝසප් ස්ටාලින් ගේ මුනුපුරා - ඔස්ට්‍රේලියානු හමුදා නිලධාරියකුගේ පුතෙක් යන නියෝජිතයෝ ඒ අතර මුල් තැනක් ගත්තෝය. තවත් එබඳු කිහිපදෙනකු සිටියද ප්‍රේක්ෂක අවධානය යොමුවන්නට ඇතතේ යට කී පිරිස වෙත බව මට සිතෙයි.

එහිදී කතා කළ එක් විශේෂඥයෙක් එය සංහිඳියාවට මං පාදන අවස්ථාවක් ලෙසින් හැඳින්වූයේය. ඒ අදහසට හේතු වූයේ යට කී පුද්ගලයන් අතුරින් දෙතුන් දෙනකු හෝ සිය ඥාතියාගේ චරියාව හා ක්‍රියා කලාපය අනුමත නොකළ නිසා ය. තමන් ඒ ගැන ලජ්ජා වන බව පවා කී අය සිටියහ. අනෙක් අතට කිසිදා පසුබෑමක් - පසුතැවීමක් - නැතිව සිය මුත්තාගේ ක්‍රියා කලාපය ගර්වයෙන් අනුමත කළ - අගය කළ - එක් පුදුගලයෙක් එහිලා කැපී පෙනුණේය. ඔහු ස්ටාලින් ගේ මුනුපුරා ය. විටෙක අනෙක් අයගේ කථාවට බාධා කරමින් තම මතය කියා පෑමට පවා එඩිතර වූ ඔහු පුන පුනා කියා සිටියේ ස්ටාලින් ඒකාධිපතියකු නොවූ බව ය. සිය ඥාතියා ක්‍රියා කළේ ජනතා අනුමැතිය හා ජනතා ප්‍රාර්ථනා ඉටු කරනු වස් බව ය. ඔහුගේ අවනීත ප්‍රකාශ ශ්‍රාවකයන් කුපිත කරවන්නට සමත් වුව ද සාකච්ඡාවට සහභාගිවූවෝ ඒ සියල්ලටම සාවධානව සවන් දීමට තරම් ඉවසීමක් - සංයමයක් පළ කළ හ.

ඇඩොල්ෆ් හිට්ලර් සමස්ත ජර්මන් ජනතාව සිය වාග් චාතුර්යය ඔස්සේ තමාගේ මතය ට හරවා ගෙන ලොවම හෙල්ලුම් කවන්නට සමත් වූයේ මහ ජනතාව නායකයන් විසින් කැමති කැමති අයුරින් මෙහෙයවනු ලැබීමට පහසු බව මුලු ලොවටම විදහා දක්වමිනි. සෝවියට් නායක ජෝසල් ස්ටාලින් අනුගමනය කළ ක්‍රමවේදය සපුරා වෙනස් වූවකි. ඔහු සතුව තිබුණු ආයුධ දෙකක් වූයේ භීෂණය හා ඝාතනය යි. රුසියාවේ කොමියුනිස්ට් පක්ෂයේ ආරම්භක සාමාජිකයන් සියලු දෙනාම (එතෙක් ඉතිරිව සිටි) ඝාතනය කිරීම ඔහුගේ විශේෂ කාර්යය බව කියනු ලැබේ. ඒ ඝාතන රැල්ලට හසු වූ පුරවැසි සංඛ්‍යාව තිස් ලක්ෂයකට අධික බව ද කියනු ලැබේ.

හිට්ලර් ගේ ක්‍රියා කලාපය අනුමත කළ කෙනෙක් එහි නොසිටියහ. සහභාගි වූ ජර්මන් හමුදා නිලධාරියාගේ මුනුපුරා වුවද සිය මුත්තා කළ කී දේ හෙළා දුටු බව කිව යුතුය. ස්ටාලින් ගේ මුනුපුරා අභිමානයෙන් ප්‍රකාශ කළ කිසිවක් ඉවත නොදැමිය හැක්කේ අදත් ඔහුගේ රුව රැගත් රුසියානුවන් වීදි සැරිසරණ සැටි දක්නට ලැබෙන නිසා ය.

අදහස් ප්‍රකාශනයට - විවේචනයට - බාධා නොපමුණුවන - හිතකර වාතාවරණයක් පැවතීම කවර දේශයක වුවද සාමකාමී නිවහල් ජනතාවක් බිහිවීමට අත්‍යවශ්‍ය බවත් සාකච්ඡාවේදී පළ වුණු අදහස් සනාථ කිරීම වැදගත් යයි සිතමි.

ටෝජෝ අගමැති ගේ මුනුපුරා සිය මුත්තා පිළිබඳව ගර්වයෙන් කතා කිරීම පුදුමයට කරුණක් නොවේ. ඒ සමගම ඔහු යුද්ධය හෝ එයින් සිදු වූ විනාශය අනුමත කිරීමට තරම් දැඩි පිළිවෙතක් අපුගමනය කළේද නැත. සිය ඥාතියාට ගරු කිරීම ජපානය බඳු රටකට සුපුරුදු චරියාව බවද පිළිගත යුතුය. ඔහු සඳහන් කළ එක් කරුණක් මගේ සිතට තදින් කා වැදුණකි. අගමැති ටෝජෝ ආහාර ගැනීමට සිරිතක් වශයෙන් වාඩි වූයේ සිය සගයන් සමග බව ඔහු අනාවරණය කළේය.

මට එක් වරම මතක් වූයේ 1975 දී පමණ දිනක මගේ "හෝචිමිංගේ සිරගෙයි දිනපොත" (පරිවර්තන) පිළිගැන්වීම සඳහා ගල්කිස්ස හෝටලයේ පැවැත්වුණු (මාපලගම විපුලසාර හිමියන්ගේ මෙහෙයවීමෙනි) දිවා භෝජනයට පැමිණි උතුරු වියට්නාම් නියෝජිතයා වාඩි වීමට කලින් තමා සමග පැමිණි රියැදුරා එහි කැඳවා වාඩි කරවා ගත් ආකාරයයි. එය සුපුරුදු කොමියුනිස්ට් චරියාවදැයි මට කිව නොහැකිය. එසේ වුවද මම එබඳු මිනිස්කම් අගය කරමි.

ස්ටාලින්ගේ චරිතය ලියන පොතක සඳහන් වූ කරුණක් ද මට මතක් වෙයි. එක්තරා සාකච්ඡාවකට සහභාගි වූ 50 කට අධික් පිරිසට අයත් සියලු දෙනාම නමින් ඇමතීමට ස්ටාලින් සමත් වූ බව එහි සඳහන් වෙයි. එබඳු පුද්ගලයකු මිනිසුන් නම්මා ගැනීමට - අවනත කරවා ගැනීමට - සමත්වීම පුදුමයක් ද නොවේ.

"ඉන්සයිට්" යන පදයට අන්තර් දර්ශනය - ඇතුළට කරපෙවීම - සැඟවුණු පැත්ත - ආදි වශයෙන් විවිධ අර්ථ දැක්විය හැකිය. මගේ හිත එබඳු වයිවාරන්න අර්ථ කථන ඔස්සේ ශ්‍රී ලංකාව වෙත දිව ගියේ එහි වත්මන් තත්වය නිසාය. සිය අනුගාමිකයන් මොනවා කළත් - මොනවා කිව්වත් - වරදක් නොදකින - දොසක් නොකියන - නායකයන් ගැන කියන කතාවක් ඇත .

"ඔහුට අර මනුස්සයා ඉනාවක් කවා ඇත"

ඉනාවකට වැඩි දෙයක් කාපු බව පෙන්වන කිහිප දෙනෙක් අද ශ්‍රී ලංකා දේශපාලන වේදිකාවට පවා පැන ඇත. මෙතෙක් කලක් මා බුද්ධිමතුන් හා ස්වාධීන මතධාරීන් හැටියට සැලකූ තුන් දෙනෙක් ඒ ගණයට ඇතුළත් වෙති. දේශපාලකයන්ට යට නොවූ එකම සිංහල ලේඛකයා වූ ගුණදාස අමරසේකර - සිහංල මහැදුරන් පරයන නිවැරදි සිංහලෙන් ලිවීමට සමත් ගණිත මහැදුරු නලින් ද සිල්වා - 1972-78 වසරවල පවත්වන ලද සේවක මණ්ඩල නියෝජිත පුහුණු පාඨමාලාවන්හිදී "විද්‍යාත්මක ප්‍රවේශය" යන සුවිශේෂ මාතෘකාව යටතේ පැය තුනක පමණ දීර්ඝ දේශනයක් පවත්වා අප මවිතයට පත් කළ වෛද්‍ය කාලෝ ෆොන්සේකා යන ත්‍රිමූර්තිය අද දවසේ මහින්ද රාජපක්ෂගේ වන්දි භට්ටයන් බවට විහින්ම පත් වීම ජාතියේ අභාග්‍යය කියා පාන අගනා (එහෙත් සෝචනීය) සාධකයකි.

එයත් "අදිසි වග තුග" හෙළි කිරීමක් ද?

LA TROBE TAXATION SERVICES
*Your friendly tax accountants*




*La Trobe Taxation Services is in operation since 2001 and provide taxation services to businesses and individuals. Our areas of specialisation are individual tax returns, business tax returns, investment properties, GST, BAS, IAS, PAYG and registering of ABR. Whenever you have tax related issues we are here to assist you as possible as we could. Our fees are very reasonable and competitive.*

*La Trobe Taxation Services*
*Registered Tax Agent*
*(ABN 67 251 931 300)*

**CONTACT**
**Bundoora:**
**Mala: - 0401000421 or 03-94708241**
**Cranbourne:**
**Janaka:- 0403728635 or 03-87868033**

**Email: latrobetax@yahoo.com.au**

**www.latrobetax.com.au**